(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(6).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 ජූලි 11 සිකුරාදා**

---

**2025 ජූලි 22 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

ජාතික විගණන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා,— ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත යටතේ නියෝග,— 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ 64, 65, 66, 69 සහ 70 වගන්ති සමඟ කියවිය යුතු 84 වගන්තිය යටතේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 මාර්තු 27 දිනැති අංක 2429/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— දුම්කොළ බදු පනත යටතේ නියමය,— සංශෝධිත, 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය යටතේ බීඩි සඳහා දුම්කොළ බද්දක් පැනවීම සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා,— තේ (අපනයන බදු සහ පාලන) පනත යටතේ නියෝග,— 1959 අංක 16 දරන තේ (අපනයන බදු සහ පාලන) පනතේ 7(1) සහ 8(2) වගන්ති සමඟ කියවිය යුතු 15 වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සභාපති විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 05 දිනැති අංක 2343/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 ජූනි 04 දිනැති අංක 2439/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.07.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 ජූලි 23 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

රබර් පාලන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 ජූලි 25 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

සමථකරණ (සිවිල් සහ වාණිජ ආරාවුල්) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2025 අගෝස්තු 05 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

307/2024

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක් එක් දිස්ත්‍රික්කය තුළ පිහිටි ජාතික හා පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල සේවයේ නියුතු මුළු ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම ගුරුවරුන් සහ විදුහල්පතිවරුන් සඳහා වැටුප් හා පාරිශ්‍රමික වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් මාසිකව හා වාර්ෂිකව වැය වන මුළු මුදල කොපමණද;

(iv) රජයේ ගුරුවරයෙකුගේ සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ පාසල් තුළ ගුරු හිඟයක් පවතින්නේද;

(ii) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම සඳහා වූ කාලසටහන කවරේද;

(iii) ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100ට වඩා අඩු සංඛ්‍යාවක් සිටින පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නාමයන් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) පසුගිය වර්ෂ පහ තුළ රජයේ පාසල්වල 1 ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) මීළඟ වර්ෂ පහ තුළ 1 ශ්‍රේණියට ඇතුළත් වෙතැයි පුරෝකථනය කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න තවදුරටත් එතුමිය වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

334/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 වර්ෂය වනවිට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති තනතුරට සහ කළමනාකාර අධ්‍යක්ෂ තනතුරට හිමි වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට එම තනතුරුවලට හිමි වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැටුපට අමතරව එම තනතුරු සඳහා හිමි වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) 2023 වර්ෂය වනවිට සහ මේ වනවිට එම වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත තනතුරු සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතන දෙකෙන්ම වෙන් වෙන් වශයෙන් වැටුප් ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම ආයතනවලින් ලබා දෙන වැටුප වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වීම වෙනුවෙන් සභාපති, කළමනාකාර අධ්‍යක්ෂ සහ සෙසු අධ්‍යක්ෂවරුන්ට ගෙවන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) සෙසු අධ්‍යක්ෂවරුන්ට ලබා දෙන වැටුප් සහ මාසික දීමනා එක් එක් අධ්‍යක්ෂකවරයා අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

569/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවට නැවත පැමිණ සේවය කළ යුතුය යන දැඩි කොන්දේසිය යටතේ විදේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධිය හෝ වෙනත් වැඩිදුර අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ජනාධිපති අරමුදල මඟින් මුදල් ලබාදී ඇති බව දන්නේද;

(ii) ඒ යටතේ හිටපු ජනාධිපතිවරුන්ගේ, ඇමතිවරුන්ගේ සහ මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට, ඥාතීන්ට සහ හිතවතුන්ට 2005 වර්ෂයට පසුව ජනාධිපති අරමුදල මඟින් මුදල් ලබාදී තිබේද;

(iii) එසේ නම්, එසේ මුදල් ලබාදී ඇති පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ දේශපාලඥයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත පුද්ගලයන් අතරින් ආචාර්ය උපාධිය අවසන් කර ශ්‍රී ලංකාවට නැවත පැමිණ ඇති පුද්ගලයන් සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට නැවත පැමිණ නැති පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවට නැවත පැමිණ නැති පුද්ගලයන් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(vii) ඔවුන් වෙනුවෙන් රජය විසින් වැය කරන ලද මුදල් අය කර ගෙන තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

806/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් අ.පො.ස (උ. පෙළ) සඳහා තාක්ෂණ, ගණිත සහ විද්‍යා යන අංශවලින් පන්ති පැවැත්වෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

(iv) මාතලේ දිස්ත්‍රික්කයේ තාක්ෂණ, විද්‍යා සහ ගණිත යන විෂය ධාරා හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

856/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාත් සභාව සතු වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහන භාවිතා කරනු ලබන නිලධාරීන් කවරේද;

(iii) මහජන නියෝජිතයන් විසින් එම වාහන පරිහරණය කරන්නේද;

(iv) එසේ නම්, එම එක් එක් මහජන නියෝජිතයාගේ නම සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පළාත් ආණ්ඩුකාරවරුන්ගේ නම් එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම එක් එක් පළාතේ සංවර්ධන කටයුතු සඳහා 2025 වර්ෂයේදී වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් පළාත් සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ අතරින් මේ වනවිට මුදල් වෙන් කර ඇති ව්‍යාපෘති කවරේද;

(v) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

858/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ, මහජන ආරක්ෂක අංශය යටතේ පවතින ආයතන කවරේද;

(ii) වර්තමාන රජය බලයට පැමිණීමෙන් පසු එම ආයතන විසින් සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව කොපමණද;

(iii) එම විමර්ශන සිදු කරන ලද්දේ කවර කරුණු සම්බන්ධයෙන්ද;

(iv) එම විමර්ශන අනුව මේ වනවිට අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් විමර්ශනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම විමර්ශන අනුව මේ වනවිට පවරා ඇති නඩු සංඛ්‍යාව කවරේද;

(vi) එක් එක් විමර්ශනයට අදාළව අත්අඩංගුවට ගෙන ඇති අවි ආයුධ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

863/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිරිවෙන් වර්ගීකරණය කවරේද;

(ii) එම පිරිවෙන්වල උගන්වනු ලබන විෂයයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම විෂයයන් කවරේද;

(iv) මේ වනවිට ඉහත පිරිවෙන්වල ඉගෙන ගනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2025 වර්ෂයේ අයවැය මඟින් පිරිවෙන් අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මඟින් පිරිවෙන් අධ්‍යාපනයට අදාළ විෂයපථය සංශෝධනය කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

867/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් රෝහල් සංඛ්‍යාව, රජයේ රෝහල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය අනුව එම එක් එක් රෝහල අයත් වන ශ්‍රේණිය සහ එම එක් එක් රෝහලෙන් සේවය ලබා ගන්නා පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති දෙනියාය මූලික රෝහල වර්ෂ 100කට වඩා පැරණි රෝහලක් බව පිළිගන්නේද;

(iii) එම රෝහල මේ වනවිට නාය යෑමේ තර්ජනයට මුහුණ දී ඉතාමත් අවදානම් තත්ත්වයක පවතින බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

878/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබාදුන් ඉඩම්වල ජනතාව පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

957/2025

ගරු අජිත් ගිහාන් මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාලයේදී, පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළ තීරයෙන් නීති විරෝධී ලෙස මත්ද්‍රව්‍ය, මත්කුඩු හා වෙනත් භාණ්ඩ රට තුළට ගෙන් වූ බවත්;

(ii) එම නීති විරෝධී ක්‍රියා මේ වනවිටත් සිදු කරමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 අගෝස්තු 06 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

633/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයේදී සිදු වී ඇති වංචා, දූෂණ සහ සාතන සම්බන්ධයෙන් දේශපාලකයන්ට සහ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව වර්ෂ 2020 සිට 2024 දක්වා කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවරා ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වනවිට නඩු කටයුතු අවසන් වී ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(iii) එම නඩු කවරේද;

(iv) ඉහත (i)හි සඳහන් නඩු අතරින් නීතිපතිවරයා විසින් ඉල්ලා අස්කරගෙන ඇති නඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම නඩු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආනයනික බහාලුම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ඇති වූ විශාල තදබදයට පිළියම් නිර්දේශ කිරීම පිණිස පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත පරීක්ෂණ කමිටුවක් පිහිටුවීමට ශ්‍රී ලංකා රේගුව විසින් කටයුතු කරන ලද බව දන්නේද;

(ii) එම කමිටුවට ඇතුළත් වූ නිලධාරීන්ගේ නම්, ඔවුන්ගේ තනතුරු නාම සහ ලිපිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත කමිටුවේ නිර්දේශ මත පරීක්ෂාවකින් තොරව නිදහස් කරන ලද බහාලුම් සංඛ්‍යාව කොපමණද;

(iv) පරීක්ෂාවකින් තොරව බහාලුම් නිදහස් කිරීමේදී ශ්‍රී ලංකා රේගුව විසින් සලකා බලන නිර්ණායක කවරේද;

(v) ශ්‍රී ලංකා රේගුව විසින් පරීක්ෂාවෙන් තොරව බහාලුම් නිදහස් කිරීම විශාල අවදානමක් බව පිළිගන්නේද;

(vi) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

653/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.02.10 වැනි දින සමස්ත ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි විදුලිය විසන්ධි කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය තීරණය කරන ලද බව දන්නේද;

(ii) එවැනි තීරණයක් ගැනීමට බලපාන ලද හේතු සාධක කවරේද;

(iii) විදුලිය විසන්ධි නොකර අඛණ්ඩ විදුලි සැපයුමක් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

704/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල්වල නම් කවරේද;

(iii) එම එක් එක් රෝහලේ පවතින වෛද්‍ය, හෙද, පරිපූරක වෛද්‍ය සේවා සහ සුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම රෝහල්වල භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

996/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපනයනය ඉලක්ක කර ගනිමින් කෘෂි බෝග නිෂ්පාදනය කරනු ලබන ගොවීන් ශ්‍රී ලංකාවේ සිටින බව දන්නේද;

(ii) ඔවුන්ට සිය කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම සඳහා ලබා දී ඇති පහසුකම් කවරේද;

(iii) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය කවරේද;

(iv) බාධාවකින් සහ අපහසුතාවයකින් තොරව සිය කෘෂි නිෂ්පාදන අපනයනය කිරීම සඳහා එම දෙපාර්තමේන්තුව විසින් තරුණ ව්‍යවසායකයන් වෙනුවෙන් ලබා දී ඇති පහසුකම් සහ ප්‍රවේශයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 අගෝස්තු 07 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

722/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති වගා කිරීමට හැකි රජයේ ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්වලට ඔප්පු ලබා දීම මේ වනවිට අත්හිටුවා ඇති බව දන්නේද;

(iv) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් අවුරුදු 25-30ක් පමණ දීර්ඝ කාලයක් භුක්ති විඳින පුද්ගලයන්ට ඉඩම් ඔප්පු/බලපත්‍ර මේ දක්වා ලබා දී නොමැති බව දන්නේද;

(v) එම පුද්ගලයන්ට ඉඩම් ඔප්පු/බලපත්‍ර ලබා දීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

918/2025

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරයේදී ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ ඉන්දීය අග්‍රාමාත්‍යවරයා අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව, ඉන්දීය රජයේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ක්‍රියාත්මක කිරීමට නියමිත සියලුම අනුමත ව්‍යාපෘති පිළිබඳ විස්තර කවරේද;

(ii) ඉහත එක් එක් ව්‍යාපෘති හඳුනාගෙන අනුමත කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාවලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘති හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී අදාළ පාර්ශ්වකරුවන්ගෙන් අදහස් විමසන ලද්දේද;

(iv) එසේ නම්, අදහස් ලබාගන්නා ලද පුද්ගලයින්ගේ/අස්ථිත්වයන්ගේ නම් සහ අනෙකුත් අදාළ තොරතුරු කවරේද?

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

970/2025

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව PL 1, PL 2 සහ PL 3 යන වැටුප් පරිමාණවල පිහිටුවා ඇති නිලධාරින් අතර උපාධිධාරින්ද සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම උපාධිධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ඌන සේවා නියුක්ත උපාධිධාරින්ට සුදුසු සේවා ස්ථාන ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(v) ඌන සේවා නියුක්ත ඉහත උපාධිධාරින් අතර වයස අවුරුදු 40 ට වැඩි උපාධිධාරින් ද සිටින බැවින්, ඔවුන්ට ලබා දෙන විසඳුම කවරේද;

(vi) ඌන සේවා නියුක්ත උපාධිධාරි නිලධාරින්ට ඔවුන්ගේ සුදුසුකම් අනුව විභාගයකින් තොරව උසස්වීම් ලබා දීමේ ක්‍රමවේදයක් තිබේද;

(vii) නොඑසේ නම්, එවැනි ක්‍රමවේදයක් හඳුන්වා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

976/2025

ගරු එම්. එස්. උදුමාලෙබ්බේ මහතා,— ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.07.12 දින අඩ්ඩාලච්චේනේ, කප්පලඩි ධීවර තොටුපොළෙන් ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා පිටත්ව ගිය, සින්න පාලමුනෙයි ප්‍රදේශයේ පදිංචි ඊ.එල්. ඉර්ෆාන් නමැති ධීවරයා තමිල්නාඩු වෙරළට ගසා ගෙන ගොස් තිබූ අතර දින 130කට පසුව 2024.11.20 දින ඔහු නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගත් බවත්;

(ii) මෙහිදී, අඩ්ඩාලච්චේනේ 06 ප්‍රදේශයේ පදිංචිව සිටි කේ. එස්. නිෂ්ෆාර් නමැති ධීවරයා මරණයට පත් වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මරණයට පත් වූ කේ.එස්. නිෂ්ෆාර් නමැති ධීවරයාට, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන් වන්දි ගෙවා තිබේද;

(ii) ඊ.එල්. ඉර්ෆාන් නමැති ධීවරයාට සහ ඔහුගේ හානියට පත් වූ බෝට්ටුවට වන්දි ගෙවා තිබේද;

(iii) එසේ නම්, ඉහත සඳහන් ධීවරයන්ට ගෙවූ වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොහොර විධිමත් කිරීමේ පනත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වර්ෂය කවරේද;

(ii) එම පනතට අනුව ව්‍යාජ පොහොර නිෂ්පාදකයෙකුට එරෙහිව පැනවිය හැකි උපරිම දණ්ඩනය කවරේද;

(iii) වෙළඳපොළේ ඇති පොහොරවල ප්‍රමිතිය සම්බන්ධයෙන් පරීක්ෂා කරන්නේද;

(iv) ශ්‍රී ලංකාව තුළ කාබනික පොහොර හා රසායනික පොහොර නිෂ්පාදනය කිරීමට හෝ ඒවා නිෂ්පාදනය කිරීම දිරිමත් කිරීමට වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1065/2025

ගරු අශෝක ගුණසේන මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දඹදෙණිය, අලව්ව, හුම්බුළුව ග්‍රාමයේ ඉඩම් ගැටලුවක් පවතින බව දන්නේද;

(ii) 1911 වර්ෂයේ මැනුම අනුව සකස් කරන ලද අංක 455 දරන හුම්බුළුව ගම් පිඹුර බලාත්මකද;

(iii) 1910 වර්ෂයේ සිට ඉහත ග්‍රාමයට අයත් වූ ඉඩම්, පුද්ගලික පාරම්පරික ඉඩම් ලෙස ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇති බව දන්නේද;

(iv) අංක 2621 දරන සන්නස ලියාපදිංචි කර තිබේද;

(v) එසේ නම්, එම සන්නස ලියාපදිංචි කරන ලද දිනය සහ අදාළ භූමි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) හුම්බුළුව විහාරය, 2013 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනතේ 4(1) වගන්තිය යටතට පත් වූ දිනය කවරේද;

(vii) හුම්බුළුව ග්‍රාමයේ ජනතාව විසින් පාරම්පරිකව භුක්ති විඳිනු ලැබූ සින්නක්කර ඉඩම්වලට හිමිකම් පෑම, 2017 වර්ෂයෙන් පසුව අහිමි කිරීමට හේතු කවරේද;

(viii) ඒ සම්බන්ධයෙන් ගම්වැසියන් දැනුම්වත් නොකිරීමට හේතු කවරේද;

(ix) මෙහිදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් 'ජනතා පරමාධිපත්‍ය බලය' උල්ලංඝනය වී ඇති බව පිළිගන්නේද;

(x) ඉහත ගැටලුව සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1067/2025

ගරු වානක මාදුගොඩ මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සඳහා මේ වනවිට ලබා දෙන සංයුක්ත දීමනාව ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(ii) එම දීමනාව වැඩි කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) එම දීමනාව වැඩි කිරීම සම්බන්ධයෙන් ඇති සීමාවන් හඳුනාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1069/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික අධ්‍යාපන ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ යන තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීමේදී, පෙර පැවති සුදුසුකම වූ ප්‍රථම උපාධියේ පන්ති සාමාර්ථයක් ලබා තිබීමේ සුදුසුකම ඉවත් කර තිබේද;

(ii) එසේම පෙර පැවති සුදුසුකමක් වූ ඉගැන්වීමේ පළපුරුද්ද ඉවත් කර තිබේද;

(iii) ඉහත තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටිය යාවත්කාලීන කිරීමේදී පෙර පැවති 'පිළිගත් ආයතනයකින් ලබාගත් පළපුරුද්ද' වෙනුවට 'පිළිගත් පෞද්ගලික ආයතනයකින් ලබාගත් පළපුරුද්ද' ලෙස සංශෝධනය කර තිබේද;

(iv) ඉහත පරිදි බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීමේ අරමුණු කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1072/2025

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් අතරින් පෞද්ගලික වතු සමාගම්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් ලබා දී ඇති එක් එක් වතු සමාගමේ නම, ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය සහ එම ඉඩම්වල වගා කර ඇති භෝග වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත වතු සමාගම්වලට ලබා දී ඇති ඉඩම් අතරින් වගාකටයුතු සිදුකර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත වතු සමාගම් අතරින්, ලබා දී ඇති ඉඩම්වල වගා කටයුතු සිදුකර නොමැති වතු සමාගම් කවරේද;

(v) එම ඉඩම් නැවත රජයට පවරා ගැනීමට සැලසුම් කර තිබේද;

(vi) ඉහත වතු සමාගම්වලින් රජයට අයවිය යුතු ආදායම් නියමිත පරිදි අය වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1080/2025

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විශේෂඥ වෛද්‍ය සේවා සංඛ්‍යාව, ඒවායේ නම් සහ එක් එක් සේවාවේ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව;

(ii) විශේෂඥ වෛද්‍යවරුන්ගේ ඌනතාවය හේතුවෙන් එම සේවා නොමැති, 2020 වර්ගීකරණය අනුව ද්විතීක, තෘතියික හා විශේෂිත සත්කාරක රෝහල් සංඛ්‍යාව සහ ඒවායේ පුරප්පාඩු සංඛ්‍යාව;

(iii) 2020-2024 දක්වා එක් එක් විශේෂඥ වෛද්‍ය සේවාවෙන් විශ්‍රාම ගිය, සේවය අතහැර ගිය, විදේශ නිවාඩු ගත්, මිය ගිය සහ ඉල්ලා අස් වූ සංඛ්‍යාව;

(iv) 2020-2024 දක්වා එක් එක් විශේෂඥ වෛද්‍ය සේවාවට තෝරා ගත් සංඛ්‍යාව;

(v) ඌනතාවය/විශ්‍රාම යැම් අනුව තරඟ විභාගයෙන් අවශ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව තෝරා ගන්නේ නම්, පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂය සඳහා තෝරා ගත් සංඛ්‍යාව;

(vi) අවුරුදු 60ට වැඩි සහ 55-60 අතර විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශේෂඥ වෛද්‍ය සේවා ලැබිය යුතු ශ්‍රේණිගත රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) පශ්චාත් උපාධි ආයතනයෙන් සහ අදාළ කොලීජියෙන් අවශ්‍ය ප්‍රමාණයට විශේෂඥ වෛද්‍යවරුන් සමත් නොකරන්නේ නම්, ඊට හේතු කවරේද;

(iii) එය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 සැප්තැම්බර් 12 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 3/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවකාශ සලසා දීම,— ශ්‍රී ලංකාවේ ඕනෑම ජාතික ක්‍රීඩා කණ්ඩායමක් නියෝජනය කරනු ලබන හෝ ජාතික මට්ටමේ වාර්තාවකට හිමිකම් කියනු ලබන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම් හෝ Z- අගය මත පදනම් නොවී ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ ඕනෑම උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය නෛතික හා උසස් අධ්‍යාපනික ව්‍යුහය රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකාවේ සියලුම අධ්‍යාපන විද්‍යා පීඨ විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම දියුණු ජාත්‍යන්තර තලයට ගෙන යාම උදෙසා පාසැල් පද්ධතියේ සියලුම ගුරුවරුන් පුහුණු උපාධිධාරී ගුරුවරුන් බවට පත් කිරීමට අවශ්‍ය වන හෙයින් ද, වර්තමානයේ බහුතරයක් ගුරුවරුන් හට තෙවසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පාඨමාලාවක් අවසානයේ උසස් ඩිප්ලෝමාවක් හිමිවන හෙයින් ද, වසර තුනක න්‍යායාත්මක පාඨමාලාවක් සහ එක් වසරක පාසැල් කේන්ද්‍රීය පුහුණුවක් සහිත සිව් වසරක උපාධි පාඨමාලාවක් ප්‍රදානය කිරීම සඳහා උචිත වන සේ දැනට ක්‍රියාත්මක අධ්‍යාපන විද්‍යා පීඨ දහනවය විශ්වවිද්‍යාල පීඨ බවට පත් කිරීමට එවකට අධ්‍යාපන අමාත්‍යවරයා විසින් 2020 පෙබරවාරි 13 දින ඉදිරිපත් කොට අනුමතිය ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණය බලාත්මක කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 5/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සලකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, බදුල්ල සහ හම්බන්තොට ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 7/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— පාසල් දරුවන්ගේ චර්යාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ චර්යාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝ විද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයේ පත්වීම් ලබාදීම විධිමත් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ ඔසවා තබන විදේශ සේවය සඳහා සිදු කරන ලද දේශපාලන පත් කිරීම් හේතුවෙන් එම සේවයේ ගුණාත්මකභාවය බිඳ වැටී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට නොහැකි වී තිබෙන හෙයින් එම තත්ත්වය වළක්වාලීම සඳහා විදේශ සේවයට සිදු

කරනු ලබන සියලුම පත් කිරීම් තරහ විභාග ප්‍රතිඵල සහ කුසලතාවය මත සිදු කිරීමට රජය විසින් වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් සකස් කිරීම,— ලංගම ඩිපෝ සඳහා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට නිසි ප්‍රසම්පාදන ක්‍රමවේදයක් නොමැති වීම, ලංකා ගමනාගමන මණ්ඩලයේ පවතින දූෂිත තත්ත්වයට ප්‍රධාන හේතුවක් වන හෙයින් මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා සුදුසු ප්‍රසම්පාදන ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල රාමුවෙන් බැහැරව, රැකියා වෙළඳපොළ හා වෘත්තීය තාක්ෂණය ඉලක්ක කොටගත් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ පාඨමාලා පිළිබඳව පාසල් සිසුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා සතු විෂයයන් විද්‍යානුකූල ක්‍රමවේදයකට සකස් කිරීම,— වර්තමානය වනවිට පළාත් සභා සතු විෂයයන් කිසිදු විද්‍යානුකූල පදනමක් නොමැති ආකාරයකට වෙන් කර තිබෙන හෙයින් ද, එමඟින් විවිධ ගැටලු මතු වී තිබෙන හෙයින් ද, මෙම තත්ත්වය වළක්වා ගැනීම සඳහා එම විෂයයන් විද්‍යානුකූල පදනමක් මත නිසි ක්‍රමවේදයකට වෙන් කර දැක්වීමට සුදුසු වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— ලංකා ගමනාගමන මණ්ඩලය ශක්තිමත් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහන සේවාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය කරුණක් හෙයින්, ලංකා ගමනාගමන මණ්ඩලය විසින් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ දී සිදුවන වංචා හා දූෂණ වළක්වා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— කිරි නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වාර්ෂිකව කිරි ආනයනය කිරීම සඳහා විශාල වශයෙන් විදේශ විනිමය මෙරටින් බැහැර වන හෙයින් මෙම තත්ත්වය වළක්වාලීම සඳහා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමේ වැඩසටහනක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/2024

ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දේශපාලනීකරණයෙන් තොර කිරීම,— ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ආයතන දැඩි ලෙස දේශපාලනීකරණය වී ඇති බව පෙනී යන බැවින්, ඡන්දයෙන් තේරී පත් වන දේශපාලනඥයින් ක්‍රීඩා ආයතනවල නායකත්ව තනතුරු සඳහා තරග කිරීම සහ ඒවා හෙබවීම තහනම් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/2025

ගරු රවී කරුණානායක මහතා,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කිරීම,— වාර්ගිකත්වය සහ ආගමික පදනම අනුව දේශපාලන පක්ෂ නම් කිරීම තහනම් කළ යුතු බවටත් ශ්‍රී ලංකාවේ දැනට උද්ගතව තිබෙන තත්ත්වය සැලකිල්ලට ගනිමින් වාර්ගික හෝ ආගමික පදනමක් දක්වන නම් දරන දැනට පවතින දේශපාලන පක්ෂ වලටද එවැනි වෙනසක් ක්‍රියාත්මක කළ යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/2025

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට සාපේක්ෂව 1%ක ප්‍රතිලාභයක් සේවකයින්ට ගෙවීම,— රජයේ ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාර අරමුදල විසින් වාර්ෂික උද්ධමන අනුපාතයට වඩා අවම වශයෙන් 1%කින් ඉහළ ප්‍රතිලාභ සේවා නියුක්තිකයින්ට ලැබෙන බවට වගබලා ගත යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/2025

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා නොමිලේ ගමන් පහසුකම් සැපයීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පොදු ප්‍රවාහන සේවා තුළ නොමිලේ ප්‍රවාහන පහසුකම් සැපයිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/2025

ගරු රවී කරුණානායක මහතා,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— සංක්‍රමණික සේවකයින් විසින් මුහුණ දෙනු ලබන පහරදීම්, පැහැර ගැනීම, ස්ත්‍රී දූෂණය, ලිංගික අපයෝජනය, මනුෂ්‍ය ඝාතනය හා මූල්‍ය වංචා ඇතුළු ගැටළු පිළිබඳව සොයා බැලීමට සහ බලපෑමට ලක් වූ සේවකයින්හට ශ්‍රී ලංකාවට ආරක්ෂිතව නැවත පැමිණීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීමට නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/2025

ගරු රවී කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වාදීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කිරීම,— විවිධ කුසලතාවලින් පිරිපුන් නව නිපැයුම්කරුවන් සහ පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා සහ ඔවුන්ගේ කුසලතා සහ නිර්මාණ වැඩිදියුණු කිරීම සඳහා ජාතික වැඩසටහනක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/2025

ගරු රවී කරුණානායක මහතා,— දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන කර්මාන්තකරුවන්ට බදු සහන,— ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීමේදී, 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන දේශීය කර්මාන්තකරුවන්ට, වසර දෙකක බදු සහනයක් ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/2025

ගරු රවී කරුණානායක මහතා,— ඡන්දය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය ලබා දීම,— ලියාපදිංචි ඡන්දදායකයින් වැඩි සංඛ්‍යාවකට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඇති අයිතිය අහිමි වී ඇති හෙයින් වඩාත් සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා වයස අවුරුදු දහ අටට වැඩි සෑම පුද්ගලයෙකුටම ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමටත්, ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වීමෙන් පසු යම් පුද්ගලයෙකු ඡන්දය ප්‍රකාශ නොකරන්නේ නම් ඔවුන්ට දඩ නියම කිරීමටත් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඇති ජනතා අප්‍රසාදය වළක්වා ගැනීමට කටයුතු කිරීම,— ජනතාවට වඩාත්ම සමීපතම මහජන නියෝජිත ආයතනවන බිම් මට්ටමේ පවතින සියලුම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් බොහෝවිට ජනතාව තුළ ඉතාමත් අසතුටුදායක හැඟීමක් පවතින හෙයින් එම ආයතන පිළිබඳ වැඩි අවධානයක් ලබා දීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/2025

ගරු ටී. කේ. ජයසුන්දර මහතා,— පිටිගල, උඩුගම, නෙලුව සහ දෙණියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදුම කන්ද ඇතුළත් කඳුවැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනාගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙලුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය වෙනස් කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— වර්තමානය වනවිට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධව සමාජයේ විශාල කතිකාවක් නිර්මාණය වී තිබෙන හෙයින්ද, එහි නිලවරණයේ දී එක්තරා සමිති කණ්ඩායමක් සතුව ක්‍රිකට් ආයතනයේ බලය පැවතීම හේතුවෙන් අක්‍රමිකතා බහුලව සිදුවන ආයතනයක් බවට පත්වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා ක්‍රිකට් ආයතනයේ ව්‍යවස්ථාව ඇතුළු සංයුතිය සංශෝධනය කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/2025

ගරු රුවන් මාපලගම මහතා,— පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්ම ඇතුළත් කිරීම,— මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/2025

ගරු රෝහණ බංඩාර මහතා,— මහාචාර්ය, ආචාර්ය තනතුරු අවභාවිත කිරීම වළක්වා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම,— වර්තමානයේ අප සමාජයේ බොහෝ පිරිස් මහාචාර්ය, ආචාර්ය වැනි තනතුරු හා නාමයන් අවභාවිත කරන හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා වැඩසටහනක් සකස් කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණන වාර්තාවේ දැක්වෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හදවත බඳු ශ්‍රී ලංකා වරාය අධිකාරිය සම්බන්ධයෙන් ඉතා වැදගත් නිර්දේශ ජාතික විගණන වාර්තාවේ දක්වා ඇති හෙයින් එම නිර්දේශ ක්‍රියාවට නැංවීමට විධිමත් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 45/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල මුදල් නිසි ලෙස මහජන සේවා සඳහා යෙදවීම,— වර්තමානය වනවිට බොහෝ පළාත් පාලන ආයතන සිය මුදල් නිසි ලෙස මහජන, සෞඛ්‍ය පොදු සේවා සහ පොදු මාවත් දියුණු කිරීම වැනි කටයුතු සඳහා නොයොදවා ලාභ ඉපැයීමේ අරමුණින් ස්ථාවර තැන්පතුවල තැන්පත් කොට ඇති බවට කරුණු අනාවරණය වී ඇති හෙයින් එම තත්ත්වය වළක්වා ගැනීමට රජය විසින් සුදුසු වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 46/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරීක්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, එබැවින් ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට ලක් නොවන හෙයින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 47/2025

ගරු රෝහණ බංඩාර මහතා,— ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම,— රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 48/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නියාමනයට යටත් කිරීම,— විදුලිය, ඛනිජ තෙල්, ඉන්ධන හා ජලය පිළිබඳ කර්මාන්ත නියාමනය කළ යුතු වුවත්, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය අධීක්ෂණය කිරීම සඳහා අදාල පනත් සංශෝධනය නොකිරීම හේතුවෙන් වසර 21කට වැඩි කාලයක සිට ඛනිජ තෙල් සහ ජලය යන කර්මාන්ත නියාමනයට යටත් නොවී තිබෙන තත්ත්වය වෙනස් කිරීම සඳහා අදාල නීතිමය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 49/2025

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ඉන්ධන පිරවුම්හල් සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාදාමය දැඩි අවිධිමත් තත්ත්වයක පවතින බැවින්, එම තත්ත්වය විධිමත් කිරීම සඳහා නියාමන වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 50/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය වැළැක්වීමට ක්‍රමවේදයක් සකස් කිරීම,— විශේෂයෙන්ම ඌව පළාත ඇතුළුව කඳුකර ප්‍රදේශවල වගා කර ඇති ෆයිනස් වගාවන් හේතුවෙන් ජල මූලාශවලට සහ පරිසරයට සිදුවන හානිය පිළිබඳව සලකා බලා ඒවා ඉවත් කර ප්‍රයෝජනවත් දේශීය වගාවන් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 51/2025

ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා පීඨයක් පිහිටුවීම,— ගුරුවරුන් සඳහා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා උගන්වනු පිණිස ජාතික භාෂා පීඨයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 52/2025

ගරු චමින්ද විජේසිරි මහතා,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් ණය වින්දිතයින් බවට පත් වූ පුද්ගලයින්හට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගත් පිරිසෙන් අති බහුතරයක් මේ වනවිට ණය වින්දිතයින් බවට පත්ව සිටින බැවින්, එම පිරිසට සාධාරණය ඉටු කිරීම සඳහා වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 53/2025

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම,— ජනතාවට විනෝදාස්වාදය සපයන ප්‍රධාන කර්මාන්තයක් වන ටෙලි නාට්‍ය කර්මාන්තය දියුණු කිරීම සඳහා සහ එම කර්මාන්තය නියාමනය කිරීම සඳහා යම් නියාමන ආයතනයක් ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 54/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— පළාත් පාලන ආයතන තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා කළ තැනැත්තන්ට එරෙහිව පියවර ගැනීම,— ශ්‍රී ලංකාව පුරා පිහිටි සියලුම පළාත් පාලන ආයතනයන්හි පසුගිය කාලය තුළ මහා පරිමාණයෙන් මහජන මුදල් අවභාවිතා වීම සම්බන්ධව කඩිනමින් පරීක්ෂණ පවත්වා ඒ සඳහා දායක වූ සියලුම බලධාරින්ට පවත්නා නීතිය අනුව දඬුවම් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 55/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික ස්ථානයක් වන මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන බොහෝ ප්‍රමාණයක් පවතින හෙයින් ද, එම ස්ථාන සංචාරක ආකර්ශණයට ලක් වී ඇති හෙයින් ද, වර්තමානය වනවිට එවැනි ස්ථාන දැඩි අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් ද, මෙම ස්ථානවල මුල් පෞරාණිකභාවයට හානියක් නොවන ලෙස සංරක්ෂණය කොට එම ස්ථාන සතු ඉඩම් කඩිනමින් මැන නිරවුල් කොට අනාගත පරපුර සඳහා ආරක්ෂා කර දෙමින් සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කිරීමට වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා "බයිතුල්මාල්" නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු (Student Counsellor) පත් කිරීම,— වර්තමානයේ බොහෝ පාසල් සිසුන් අතර විවිධ මානසික පසුබෑම් දක්නට ලැබෙන හෙයින් ද, මෙම තත්ත්වයන් ඔවුන්ගේ ශාරීරික හා සමාජීය පැවැත්ම සඳහා චක්‍රාකාරව බලපාන හෙයින් ද, ඇතැම් අවස්ථාවලදී පාසල් සඳහා පාසල් මනෝ උපදේශකවරයන් පත් කර තිබුණ ද එම තනතුර සඳහා පාසල් ගුරුවරුන්ගේ භූමිකාවද ඇතුළත්වීම හරහා ඉන් බලාපොරොත්තු වන සේවය ඵලදායීව සිදු වී නොමැති හෙයින් ද, සෑම පාසලකටම මනෝ උපදේශකයකවරයෙකුගේ අවශ්‍යතාවය මතු වී ඇති හෙයින් ද, පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය හා පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු පත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රටවිරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය පණ ගැන්වීම සඳහා විදෙස්ගත ශ්‍රමික ප්‍රජාවගෙන් ලැබෙන දායකත්වය ඉතා සුවිශේෂ වන හෙයින් ද, ආර්ථික අර්බුදය හමුවේ විදෙස් රටවල වසර ගණනාවක් රැකියා කිරීමෙන් අනතුරුව නැවත ශ්‍රී ලංකාවට පැමිණ තම දූ දරුවන්ද සමඟින් ජීවිකාව ගෙන යන ඔවුන්ට ඇතැම් අවස්ථාවලදී නැවත රැකියාවක් කිරීමට තරම් හැකියාවක් නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදුවන හෙයින් ද, ඔවුන්ගෙන් විදේශ විනිමය වශයෙන් ලැබෙන මුදලින් යම් ප්‍රතිශතයක් යොදාගෙන විශ්‍රාම අරමුදලක් පිහිටුවා විශ්‍රාම යෝජනා ක්‍රමයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.